අඩ්ඩාලෙයිචේනෙයි ප්‍රාදේශීය සභාව
අම්පාර දිස්ත්‍රික්කය
---------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 13 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 15 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ඔක්තෝබර් 25 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට අඩ්ඩාලෙයිචෙනෙයි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිතිවලට අනුකූලවීම
-----------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත් කරයුතු වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පුරනැගුම(නෙලිෂිප්) වැඩ සටහන යටතේ ගොඩනැගිලි සහ මාර්ග ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් කරුවන් හතර දෙනෙකුට සමාලොචිත වර්ෂය අවසානය දක්වා ගෙවූ මුදල වශයෙන් රු. 76,159,314 ලෙජරයේ සටහන් කර තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල එම මුදල රු. 99,860,690 වශයෙන් පෙන්වා තිබීමෙන් රු. 23,701,376 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ලෙජරය අනුව, සතුන් ඝාතනය කිරීම් සහ එවායේ අපද්‍රව්‍යව ඉවත් කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබුණු ආදායම රු. 3,434,950 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු. 3,499,900 ක් ලෙස පෙන්වා තිබීමෙන් ලැබූ ආදායම් රු. 64,950 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2005 වර්ෂයේදී අස්ථානගතවූ රු. 96,392 ක් වටිනා විදුලි උපකරණ තොගය ගිණුම් ප්‍රකාශන වල ඉතිරි තොග ශේෂය වශයෙන් දිගටම පෙන්වා තිබුණි.

(ඈ) ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය වෙනුවෙන් කාරෙයි තීවු ප්‍රාදේශීය සභාවෙන් සමාලෝචිත වර්ෂයේ මැයි මාසය සිට දෙසැම්බර් මාසය දක්වා ලැබියයුතු ගාස්තු රු. 1,038,678 ක මුදල වත්කමක් වශයෙන් දක්වා නොතිබුණි.

(ඉ) 2014 දෙසැම්බර් 31 ක් දිනට වූ රු. 41,650 ක් වටිනා විදුලි භාණ්ඩ තොගය ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඊ) 2012 සහ 2013 වර්ෂය වලදී භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දෙශයන් අනුව විනාශවූ පුස්තකාල පොත්වල අගය තක්සේරුකර පොත්පත්වල ගැලපීම් කර නොතිබුණි.

(උ) ප්‍රාදේශිය සභාව යටතේ පවත්වාගෙනයනු ලබන පුස්තකාල පහකට සමාලෝචිත වර්ෂයේදී ඒෂියන් ෆවුන්ඩේෂන් ආයතනය සහ ප්‍රාදේශීය පළාත් පාලන උප කොමසාරිස් විසින්

පරිත්‍යාගක් වශයෙන් ලබාදුන් පුස්තකාල පොත් 526 ක වටිනාකම් වන රු. 125,426 ක් වත්කම් ගිණුම්වලට ගෙන නොතිබුණි.

1.3.3 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

(අ) 2005 වර්ෂයේ සිට 2012 වර්ෂ දක්වා හිඟව තිබූ මස් කඩ බදු මුදල වන රු. 273,300 ක මුදල අයකර ගැනීම සඳහා 2015 සැප්තැම්බර් 11 විගණන දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) වීථි පහන් සහ විදුලි පාරිභෝජනය වෙනුවෙන් ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබියයුතු රු. 350,322 ක මුදල අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු නොකර දිගටම මූල්‍ය ප්‍රකාශනවලට ගෙනවිත් තිබුණි.

1.3.4 නීති, රීති , රෙගුලාසි හා කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 12(1) සහ (2) වගන්ති සහ පළාත් පාලන, නිවාස සහ ඉදි කිරිම් අමාත්‍යංශයේ 1988 ජනවාරි 13 වන දින අංක 488/16 දරණ ගැසට් පත්‍ර දැන්වීමේ 31(1) වන උප වගන්ති | ප්‍රාදේශිය සභාවේ කටයුතු ලිහිල් කිරීමේ අදහසින් අංගසම්පූර්ණ තීරණ ගැනීම සඳහා සහ උපදෙස් ලබා දීම සඳහා සභාවේ මුදල්, ප්‍රතිපත්ති සැලැසුම්, නිවාස ඉදිකිරීම්, සමාජ සංවර්ධන, තාක්ෂන සේවා, පාරිසරික සහ පොදු පහසුකම් යන කරුණු සඳහා වෙන් වශයෙන් කාරක සභා පත්කර තිබුණද මුදල් හැර අනිකුත් කාරක සභා සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක වී නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 571(2) | වර්ෂ හතරක් ඉක්මවූ රු. 1,507,537 ක් කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් ඒවා ගෙවීමට හෝ ආදායමට ගැනීමට 2015 සැප්තැම්බර් 11 වන දිනය දක්වා කටයුතු කර නොතිබුණි. |

2 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 6,249,699 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 8,360,916 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 2,111,217 ක් පිරිහීමක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්‍යසාධනය

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් අයකරගත් ආදායම් අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය.

| ආදායම් විෂයය | ඇස්තමෙන්තුගත ආදායම් | අයකළ අදායම් | අයනොකළ ආදායම් | අයනොවූ ආදයම් ඇස්තමෙන්තුගත ආදායමෙන් ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| වරිපනම් | 156,000 | 20,965 | 135,035 | 13.4 |
| බදු | 1,560,000 | 396,575 | 1,163,425 | 25.4 |
| බලපත්‍ර ගාස්තු | 1,020,000 | 432,500 | 587,500 | 42.4 |
| සේවා සඳහා ගාස්තු | 8,280,000 | 5,481,221 | 2,798,779 | 66.2 |
| මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් | 15,010,000 | 4,907,149 | 10,102,851 | 32.6 |

2.2.2

(අ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය (vii)(8) සහ (xxx) උප වගන්ති අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශියෙ පුද්ගලික ආයතක 06 කින් තමන්ගේ වෙළඳ භාණ්ඩ ප්‍රචාරය කිරීම සඳහා ස්ථාපිත කර තිබූ වෙළඳ දැන්වීම් පුවරු 31 කින් බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. ඒ හේතුවෙන් වාර්ෂිකව රු. 461,550 ක ආදායමක් අහිමිවී තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයතුල ස්ථාපිත කර තිබූ සන්නිවේදන කුළුනු 07 කින් අයකරයුතු හිමිකම් ගාස්තු 2015 සැප්තැම්බර් 11 වන දිනය දක්වා අය නොකිරීම නිසා සමාලොචිත වර්ෂයේදී රු. 548,800 ක ආදායමක් අහිමිවී තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටා තිබූ වෙළඳ සමාගම් 35 කින් අයවියයුතු බලපත්‍ර ගාස්තු රු. 104,200 ක් 2015 සැප්තැම්බර් 11 වන දිනය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2000 වර්ෂයේ සිට 2007 වර්ෂය අවසානය දක්වා සේවක වැටුපෙන් අයකර ගන්නා ලද සේවක අර්ථ සාධක අරමුදල් දායක මුදල්වල එකතුව රු. 142,459 ක් සේවක අර්ථ සාධක අරමුදලට යැවීමට විගණන දිනය වන 2015 සැප්තැම්බර් 11 දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 සහ 2014 වර්ෂවලදී ප්‍රාදේශීය සභාව විසින් ප්‍රධාන මාර්ගවල සවිකිරීම සඳහා රු. 1,316,000 ක් වටිනා සෝඩියම් වර්ෂයේ විදූලි බුබුදු 100 ක් සහ එයට අවශ්‍ය සවිකිරීම් මිලදී ගෙන සවිකර තිබුණද, ඉන් විදූලි බුබුලු 21 ක් පමණක් ක්‍රියාත්මක තත්වයේ තිබුණු අතර අනෙතුත් විදූලි බුබුලු 79 ක් වර්ෂයක පමණ කාලයක සිට ක්‍රියාවිරහිත තත්‍යයේ තිබුණි. මේ සම්බන්ධයෙන් විගණන දිනය වන 2015 සැප්තැම්බර් 11 දිනය දක්වා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඇ) ඇතුලත මාර්ගවල සවිකිරීම සඳහා රු. 719,900 කට විදූලි 2300 ක් බුබුලු සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණි. එම බුබුලු වලින් 600 කට වඩා වැඩි ප්‍රමාණයන් සවිකර තිබුණද වගකීම් කාලය ඇතුලත පිළිසිස් තිබූ අතර එවා මාස 06 කට වඩා වැඩිකාලයක් ගබඩාවේ තිබුණද, මේ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග කිසිවත් ගෙන නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඕලුවිල් සිට පාලමුනේ දක්වාවූ, ප්‍රධාන මාර්ගයේ සූර්ය බලයෙන් (Solar Power) ක්‍රියා කරන විදූලි බුබුලු 06 ක් රු. 510,000 ක මිලදී ගෙන 2014

ජනවාරි මාසයේ සවිකර තිබුණද 2014 මාර්තු මාසයේ සිට ක්‍රියාවිරහිතවී තිබණද, එය අළුත්වැඩියා කිරීම සඳහා 2015 සැප්තැම්බර් 14 විගණන දිනය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඉ) විවිධ ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලැබුණු වාහන 03 ක් වසර 05 කට වඩා වැඩි කාලයක් සභාව විසින් ධාවනයේ යොදවා ගෙන තිබුණද එම වාහන සභාවේ නමට මාරු කර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඊ) ප්‍රාදේශීය සභා විසින් 2012 වර්ෂය සහ 2013 වර්ෂය වෙනුවෙන් පවත්වන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ වර්ග 24 ක වත්කම් 198 ක ඌණතාවයක් පෙන්වා තිබුණද මේ සම්බන්ධයෙන් 2014 නොවැම්බර් 26 දක්වා කළමනාකරණය විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

(අ) පොදු වෙළඳ පොළ ගොඩනැගිලි ඉදිකිරීම්
---------------------------------------------

පොදු වෙළඳ පොළ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිමකර 2015 මැයි 15 දින මහජන ප්‍රයෝජන සඳහා කඩ කාමර 05 ක් විවෘත කර තිබුණද, එම ගොඩනැගිලි සංකීර්ණයේ තිබෙන කඩ කාමර 1 ක් පමණ බදු දී ප්‍රයෝජනයට ගෙන තිබුණි.

(ආ) කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම්
-------------------------------------

විගණනයට ලැබුණු තොරතුරු අනුව මෙම ඉදිකිරීමට අදාල කොන්ත්‍රාත්කරු බැංකුවකින් ලබාගෙන ඉදිරිපත්කර තිබූ රු. 8,686,787 වටිනා අත්තිකාරම් බැදුම්කරය සහ රු. 2,171,700 ක් වටිනා කාර්යසාධන බැදුම්කර 02 ක් එම බැංකුවෙන් නිකුත්කළ එවා නොව ව්‍යාජ ඒවාබව දැනගෙන තිබුණද සභාව විසින් 2015 සැප්තැම්බර් 14 වන දිනය දක්වා කොන්ත්‍රාත්කරුට විරුද්ධව නීතියානුකූලව කටයුතු කර නොතිබුණි.

(ඇ) කොන්ක්‍රීට් පාර - ජුම්මා පල්ලිය පාර
-----------------------------------------

ජුම්මා පල්ලිය මාර්ගයට කොන්ක්‍රීට් දමා වැඩිදියුණු කිරීම් සඳහා සකස්කරණ සැලැසුම් අනුව මි.මී 6 ක් ප්‍රමාණයේ කම්බි කිලෝග්‍රෑම් 3,516 යෙදවිය යුතුයි. කෙසේවූවද, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත්කරන ලද මිණුම් වාර්තා අනුව කම්බි කිලෝ ග්‍රෑම් 2,860 පමණක් යොදවා ඇති බැවින් මාර්ගයේ පැවැත්ම ප්‍රශ්නාර්ථයක් වී ඇත.

(ඇ) ඝාතනාගාර ගාස්තු
---------------------

ප්‍රදේශීය සභාව විසින් 2005 වර්ෂයේදී රු. 680,000 ක් වැයකර ප්‍රතිසංස්කරන ලද ඝාතකාගාරය සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) පුද්ගලික පාර්ශවයන්ගේ ඉඩමක මෙම ගොඩනැගිල්ල ඉදිකරදී දිබුණද ඉඩමේ අයිතිය පවරා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ii) ඝාතකාගාරයේ බිත්ති, දොර සහ ජනෙල් යනාදීය සමාලෝචිත වර්ෂයේදී රු. 223,660 ක මුදලක් වැයකර අළුත්වැඩියා කර තිබුණද, අළුත්වැඩියාකර මාස 6 කින් දොර සහ ජනෙල් නැවන කැඩී තිබුණි.

(iii) ඝාතනය කරන ලද සතුක්ගේ සම සහ අනෙකුත් අපද්‍රව්‍ය එවෙලේම ඉවත් නොකර දින කිපයක් රදවා තැබිමෙන් අවට වැසියන්ට පරිසර හානි සිදුකර තිබුණි. මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය අධිකාරී කාර්යයෙන් අවවාද කර තිබුණද 2015 සැප්තැම්බර් 14 දක්වා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් රැස්කිරීම්

(ඇ) අයවැය පාලනය

(ඈ) ස්ථාවර වත්කම් පාලනය